**ශ්‍රී ලංකා කජු සංස්ථාව - 2010**

---------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා කජු සංස්ථාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම් (ශ්‍රී.ලං.ගි.ප්‍ර.)**

----------------------------------------------------

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.03 | මූල්‍ය පකාශන සකස් කිරීමේ වගකීමේ ප්‍රකාශය සඳහන් කර ගිණුම් සහතික කළයුතු වුවද ගිණුම් වල ඒ බව සඳහන් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.16 | සේවා කාලය වර්ෂයක් වන සේවකයන් සඳහා පාරිතෝෂික වෙන් කිරීම සදු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.18 | ඉඩම්වල වටිනාකම රු. 4,452,241,129 ක් වශයෙන් ප්‍රත්‍යාගණනය කර තිබුණද ඒ සම්බන්ධයෙන් ගිණුම්වල හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.24

(i) දිගුකාලීනව ඉදිරියට ගෙන එන එකතුව රු.5,870,075ක් වූ වෙනත් පාර්ශවයන්ගෙන් ලද ප්‍රදාන, ලැබුණු වත්කම් හෝ ඉදිකරන ලද සංවර්ධන කාර්යයන් හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ii) රාජ්‍ය අනුග්‍රහයන් හා රාජ්‍ය ප්‍රදාන ගිණුම් ගත කිරීමේදී යොදාගත් ගිණුම් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කිරීමට භාවිතා කරන ගිණුම්කරණ ක්‍රමය ඇතුළු අනෙකුත් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(iii) ප්‍රාග්ධන ප්‍රදාන වලින් නිර්මාණය වූ වත්කම් වෙනුවෙන් ක්ෂය ප්‍රතිශතයට සමාන ප්‍රමාණයක් ආදායම් ලෙස වාර්ෂිකව හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වුවද රු.257,602,107 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන වෙනුවෙන් ක්‍රමක්ෂය ලෙස හඳුනාගෙන තිබුණේ රු. 2,462,643 පමණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

### 1.2.2.1 ගිණුම්වල වැඩියෙන් දැක්වීම

------------------------------

(i) ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.38,100,000 ක මුදලින් රු.7,987,334 ක මුදලක් පුනරාවර්තන ප්‍රදාන ලෙස සලකා අයභාර ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩිපුර දක්වා තිබුණි. කෙසේ වෙනත් අයභාර හෝ ප්‍රාග්ධන වියදම් නිශ්චිතව හඳුනාගැනීමට අදාලව ගිණුම් ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ii) කොන්ඩච්චි වත්තේ වත්කම් (ඉඩම් හැර) වශයෙන් රු.46,515,043 ක මුදලක් ගිණුම් වල දක්වා තිබුණද එම වත්කම් බොහෝමයක් භෞතිකව නොපැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශේෂ පත්‍රයේ දක්වා ඇති වත්කම්වල අගය නිවැරදිව දක්වා නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### 1.2.3.1 ලැබිය යුතු ගිණුම්

රු.2,022,372 ක් වූ බාහිර ණයගැතියන් සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබූ අතර කමන්දළුව වත්ත සහ ව්‍යාප්ති අංශයේ ඇති එකතුව රු.12,829 ක් වූ වර්ෂ 06 ක් ඉකුත් වී ඇති ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ණයගැති හා ණයහිමි වටිනාකම පිළිවෙලින් රු. 11,054,122 ක් හා රු. 9,364,490 ක් විය. ඒ සඳහා ශේෂ සනාථ කිරීම් ලබාගෙන නොමැති අතර අදාළ ලේඛනද පවත්වාගෙන ගොස් නොතිබුණි. ණයහිමියන් සඳහා කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.5 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි (මු.රෙ.) | |
| i.මු.රෙ. 757(2) | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| ii.මු.රෙ. 1646 | වාහන 21 ක් සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) චක්‍රලේඛ | |
| i. 1973 මැයි 25 දිනැති කජු සංස්ථාව පිහිටුවීමේ අතිවිශේෂ ගැසට් පත්‍රය හා 2009 මැයි 26 දින අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | උප සභාපති තනතුරක් සඳහා ප්‍රතිපාදන නොතිබියදී විෂයභාර අමාත්‍යවරයා උප සභාපතිවරයෙකු පත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.255,999 ක මුදලක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. මෙම ගෙවීම් වලට අමතරව උප සභාපති සඳහා රියදුරෙක් සමග වාහනයක් වෙන්කර දී ඉන්ධන දීමනාවක් ගෙවීම හා දුරකථන බිල්පත් නිරවුල් කිරීම ආයතනය විසින් සිදුකර තිබුණි. |

| | | |
|---|---|---|
| ii. | 2003 ජුනි මස 02 දින අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.3.4 වගන්තිය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ආයතනයේ සභාපති වෙත මසකට රු.11,694 බැගින් රු.81,859 ක දුරකථන දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. |
| iii. | 2005 ජනවාරි 31 දින අංක පීඊඩී 28 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වාහන කුලියට ගැනීමේදී රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් අනුව සකස් කළ ගිවිසුමක් නොතිබුණි. |
| iv. | 2006 ජනවාරි 25 දින අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛය 3.2 වගන්තිය. | මිරිජ්ජවිල කපු අලෙවි සැලෙහි ඉදි කිරීම් සඳහා රු.909,015 ක වියදමක් දරා තිබුණද ඒ සඳහා මිල ගණන් කැඳවීමක් සිදු කර නොතිබුණි. |
| v. | 2008 නොවැම්බර් 19 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊ/සීඕ/එම්ස/27/2 වෙළුම iii දරන ලිපිය | සංස්ථා කාර්ය මණ්ඩලයට ප්‍රවාහන දීමනාවක් ගෙවිය නොහැකි බව දන්වා තිබුණද ඊට පටහැනිව නිලධාරීන් සඳහා මාසිකව රු.1500 හා රු.5000 බැගින් ප්‍රවාහන දීමනාවන් ගෙවා තිබුණි. |
| vi. | ආයතන සංග්‍රහයේ viii පරිච්ඡේදයේ 10.2 වගන්තිය | සති අන්තයේ හෝ රජයේ නිවාඩු දිනවල රාජකාරියේ යෙදී නිවාඩු දින වැටුප් ලබාගන්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය සමාලෝචනය

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවලින් රු. 15,055,181 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 11,759,352 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී රු. 3,295,829 කින් ඌනතාවය වැඩිවී තිබුණි. එයට බලපෑ හේතු වූයේ පැල තවාන් වියදම් හා ප්‍රධාන කාර්යාල වියදම් පිළිවෙලින් රු.මිලියන 3.2 හා රු.මිලියන 4.3 කින් ඉහළ යාමයි.

2.2 **මෙහෙයුම් සමාලෝචනය**
---------------------------

2.2.1 **කාර්ය සාධනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කජු ශාකයේ උපරිම ඵලදායි ජීව කාලය වසර 30 ක් වුවද එළුවන්කුලම වත්ත හැර අනෙකුත් සියලුම වතුවල ඵලදායි ජීව කාලය පසුකර තිබුණි.

(ආ) ආයතනයට හිමි වතු සහ ඒවායේ ඵලදාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්ත | මුළු ඵලදාව | අක්කර ගණන | අක්කරයක සාමාන්‍ය ඵලදාව |
|---|---|---|---|
| ------ | ------------ | ---------- | -------------- |
| | (කි.ග්‍රෑ) | | (කි.ග්‍රෑ) |
| පුත්තලම වතුයාය | 20080 | 143 | 140 |
| කමංදළුව වතුයාය | 15790 | 368 | 42 |
| හාඩි වතුයාය | 3517 | 200 | 17.58 |
| එළුවන්කුලම වතුයාය | 55000 | 200 | 275 |
| | 94387 | 911 | 103.6 |

වගාවන්හි සාමාන්‍ය ඵලදාව අක්කරයට කි.ග්‍රෑ.103.6 ක් වන අතර පෞද්ගලික අංශයේ ඵලදාව අක්කරයට කි.ග්‍රෑ.600 කි. මෙය කලාපීය රටවල් සමග සැසඳීමේදී අක්කරයට කි.ග්‍රෑ. 2000 ක් පමණ වේ.

(ඇ) ලෙලි කජු වලින් කජු මද නිෂ්පාදනය කිරීමේදී සිදුවන බර අඩුවීම හා අපතයන් සම්මත මට්ටමකින් පවතින්නේද යන්න තීර්ණය කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රමිත අනුපාතයන් හා සම්මතයන් ස්ථාපිත කර නොතිබුණි.

(ඈ) කජු වගාව ව්‍යාප්ත කිරීමට සහ පර්යේෂණ හා සංවර්ධන අංශය වෙනුවෙන් පසුගිය වර්ෂ 6 ක් තුල දරන ලද වියදම් පහත පරිදි වේ.

| වර්ෂය | ව්‍යාප්ත කිරීමේ වියදම් | පර්යේෂණ හා සංවර්ධන වියදම් |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2005 | 5.6 | 23.1 |
| 2006 | 5.1 | 33.1 |
| 2007 | 5.7 | 38.6 |
| 2008 | 5.5 | 50.3 |
| 2009 | 5.1 | 55.6 |
| 2010 | 5.2 | 49.6 |

2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම ප්‍රමාද වීම නිසා අධිභාර ලෙස රු.28,102 ක් ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා කජු සංස්ථාවට ව්‍යාපෘතියකින් භාරදෙන ලද අංක ඩබ්.පී.ජේවයි 8403 දරන වාහනයේ අයිතිය පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.2.3 අයවැය ලේඛනමය පාලනය

1971 අංක 38 දරන මුදල් පනතේ 8.3 වගන්තිය හා 2003 ජුනි 02 දින අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.2.1 වගන්තිය ප්‍රකාර සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

2.2.4 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සංස්ථාවේ කළමනාකරණ සහ විධායක ශ්‍රේණියේ තනතුරු වල පුරප්පාඩු 11 ක් පැවතුන අතර විධායක නොවන ශ්‍රේණි වලද අනුමත සේවක සංඛ්‍යාවෙන් 10 ක් පුරප්පාඩු වී තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු 37 ක් පුරප්පාඩුව තිබිය දි අනියම් හා කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයන් 56 දෙනෙකු බඳවාගෙන තිබූ අතර අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 49 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. 2010 වර්ෂය සඳහා එම සේවකයන් සඳහා ගෙවූ වැටුප් හා දීමනාවල එකතුව රු.2,647,440 ක් විය.

3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු ය.

(අ) ගිණුම්කරණය
(ආ) ගබඩා පාලනය
(ඇ) මානව සම්පත් කළමනාකරණය
(ඈ) අලෙවිසැල් වෙත භාණ්ඩ නිකුත් කිරීම
(ඉ) වටිනා ගස් සහ යළි වගාව සම්බන්ධ වාර්තා පවත්වාගෙන යාම
(ඊ) සදොස් පරිගණක පද්ධතිය